GMOA

ESTABLISHED IN 1926

TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

10/11/2012

## මාධ්‍ය නිවේදනයයි

සියඹලාන්ඩුව මූලික රෝහලේ වෛද්‍යවරුන්ගේ අධික හිඟයක් තිබියදිත් පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමිය විසින් අත්තනෝමතික ලෙස මෙම රෝහලෙන් වෛද්‍ය නිලධාරිනියක් වෙනත් රෝහලකට මුදා හැර ඇත. මෙම රෝහලේ සිටිනුයේ කායික රෝග විශේෂඥ වෛද්‍යවරයා ඇතුළුව වෛද්‍යවරුන් හය දෙනෙකු පමණි. දැඩි දුෂ්කරතා මධ්‍යයේ වුවද මෙතෙක් කල් රෝගී සත්කාර පවත්වාගෙන යාමට මෙම වෛද්‍යවරුන් දැඩි කැප කිරීමෙන් කටයුතු කර ඇත. බාහිර රෝගී අංශය ඇතුළු වාට්ටු පහක් හා සායන හයක් පවත්වාගෙන යාම මෙම වෛද්‍යවරුන් හයදෙනා හට නොහැකි බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මොණරාගල ශාඛාව අප වෙත දන්වා ඇත. පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමියගේ මෙම අත්තනෝමතික තිරණය මඟින් උද්ගතවූ අර්බුදය තුලින් රෝගී සත්කාර අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගතවී ඇත.

එසේ හෙයින් දැනට සිටින වෛද්‍යවරුන් දැඩි කැපවීමෙන් බාහිර රෝගී අංශය පමණක් ක්‍රියාත්මක කිරීමටත් රෝගීන් ඇතුලත් කිරීම හා සායනික කටයුතු මුළුමනින් නවතා දැමීමටත් තිරණය කර ඇත. මෙහිදී අදාල රෝහලෙන් වෛද්‍යවරුන් බැහැර කිරීමේදී සම්මත වෛද්‍ය නිලධාරීන් මුදා හැරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීමට පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකතුමිය අපොහොසත් වීම නිසා ඇතිවූ අර්බුධකාරී තත්වය සමනය කිරීමට අවශ්‍ය වෛද්‍ය නිලධාරීන් රෝහලට ලබා දෙන තුරු මෙම වෘත්තිය සමිති ක්‍රියා මාර්ගය අඛණ්ඩව කරගෙන යාමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ එම ශාඛාව තිරණය කර ඇත. මෙම තත්ත්වය නිර්මාණය කල සෞඛ්‍ය බලධාරීන් විසින් රෝගීන්ට සිදුවන අපහසුතාවයන්ට සෘජුව වගකිව යුතු බව රජයේ වෛද්‍ය නිලධාරී සංගමයේ අවධාරණයයි.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය මංජුල ඇපා 0773262270
වෛද්‍ය නලින්ද හේරත් 0717876516
වෛද්‍ය නවීන් සොයිසා 0718582444